# ජාතික ලොතරැයි මණ්ඩලය-2011

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික ලොතරැයි මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,820,507 ක් වටිනා ඉදිරියේදී දිනුම් ඇදීමට නියමිත ලොතරැයිපත 3,474,920 ක් මණ්ඩලයේ ගබඩාව වෙත අදාල සැපයුම්කරුවන් විසින් බාර දී තිබුණ ද එම සැපයුම් වෙනුවෙන් සැපයුම්කරුවන්ට ගෙවිය යුතු බැරකම් මෙන්ම තොග පිරිවැය ද ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මණ්ඩලය ටිකට්පත් මුද්‍රණය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.376,528,826 ක් හා ඉකුත් වර්ෂයේදී රු.293,504,383 ක් වැය කර තිබුණ අතර මෙම වියදම් සෘජු වියදම් ලෙස ගිණුම්වල හෙළදරව් කල යුතු නමුත් වෙනත් වියදම් ලෙස අනුචිතව හෙළදරව් කර තිබුණි.

#### 1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික ලොතරැයි මණ්ඩලයට අනුබද්ධ සෙවණ ලොතරැයිය මගින් 1993 සිට 1996 වසර දක්වා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව වෙත ලබා දී තිබූ රු.89,601,618 ක ණය මුදල් සහ ඒ වෙනුවෙන් ලැබිය යුතු රු.96,075,562 ක් වූ පොලිය සමාලෝචිත වර්ෂය දක්වාම අයකර ගෙන නොතිබුණි.

(ආ) සෙවණ ලොතරැය නියෝජිතයන්ගෙන් මණ්ඩලය වෙත 1996 වර්ෂයේ සිට අයවිය යුතුව තිබූ රු.1,405,968 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම අයකර ගෙන නොතිබුණි.

(ඇ) 2003 වසරේ සිට දිස්ත්‍රික් අලෙවි නියෝජිතයන් වෙත ගෙවිය යුතුව තිබූ රු.1,314,430 ක සේවා ගාස්තු බේරුම් කිරීමට පියවර නොගෙන රඳවා ගැනීම් ලෙස ගිණුම් වල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

## 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් සම්බන්ධව ඊට ඉදිරියේ දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

| | විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|---|
| (අ) | සංචාරක බංගලා වැඩි දියුණු කිරීම | 7,403,596 | මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය |
| (ආ) | ත්‍යාග ප්‍රදානය සඳහා මිලට ගෙන තිබූ ස්වර්ණාභරණ | 2,266,430 | i. අඩංගු රන් බර පිළබඳ වාර්තා<br>ii. පිළගත් ආයතනයක් මගින් නිකුත් කරන ලද තොග සතොක්ෂණ වාර්තා |

## 1.2.4 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකුල නොවීම

විගණනයේදී පහත සඳහන් අනුකුල නොවීම් අවස්ථා නිරික්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකුල නොවීම |
|---|---|---|
| (අ) | 1997 අංක 35 දරන මුදල් පනත මගින් සංශෝධිත1963 අංක 11 දරන මුදල් පනතේ 20 වගන්තිය | 2008 අගෝස්තු 22 දින නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කරන ලද කෙටුම්පත් රීති වලට අනුකුලව අරමුදල් වෙන් කිරීම හා තැගි ව්‍යුහගත කිරීම සිදුකර වාර්තාවේ දිනය දක්වාම ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. |
| (ආ) | 1983 අංක 12 දරන පාර්තෝෂික | පාර්තෝෂික ගෙවීම් පනත අනුව නිලධාරීන් සඳහා පාර්තෝෂික වශයෙන් අවසාන වරට ලැබූ වැටුපෙන් මාස |

| | |
|---|---|
| ගෙවීම් පනතේ 6 (2) (අ) වගන්තිය | 1/2 ක වැටුප වෙන් කල යුතු වුවත් ඊට පටහැනිව විධිමත් අනුමැතියකින් තොරව මසක වැටුප වශයෙන් රු. 65,695,595 ක වෙන් කිරීම් සිදු කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුල විශ්‍රාම ගිය නිලධාරීන් සඳහා රු.12,126,300 ක් ගෙවීම් කර තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i. අංක 502 වැනි මුදල් රෙගුලාසියේ 11 වැනි පරිශිෂ්ඨයේ 3 වැනි උපලේඛනය | පොත් අගය රු.388,203,362 ක් වූ ස්ථාවර වත්කම් වෙනුවෙන් මණ්ඩලය විසින් ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබුණි. සත්‍යාපනය කරන ලද වත්කම් ස්ථාවර වත්කම් ශේෂයට ගලපා නොතිබුණු අතර ඒ අනුව නැතිවීම්, අස්ථානගත වීම් නිසා සිදුවන පාඩු මූල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කර නොතිබුණි. |
| ii. අංක 685 වැනි මුදල් රෙගුලාසිය හා 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛය | මණ්ඩලය ටිකට් මුද්‍රණය සඳහා මුළු මෙහෙයුම් වියදම් වලින් 29 % ක ප්‍රතිශතයක් වැය කර තිබුණු අතර ඉන් 20.7% ක්ම පෞද්ගලික ආයතන වලින් ඉටුකරවාගෙන තිබුණ මුද්‍රන කටයුතු වෙනුවෙන් වැය කර තිබුණි. නමුත් මෙම වියදම් සඳහා ලංසු පර්පාටි අනුගමනය කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මුද්‍රණ වියදම් වලින් රු.267,387,445 ක් ලංසු කැඳවීමකින් තොරව සිදු කර තිබුණි. |
| (ඈ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| 9 පරිච්ඡේදයේ 7 ජේදය | i. සභකාර සාමාන්‍යාධිකාරී අලෙවි, බෙදාහැරීම් සහ නියෝජිත කළමනාකරණ තනතුරු සඳහා බඳවාගෙන තිබූ නිලධාරීන තිදෙනෙකුට හිමි රු.25,640 ක වැටුප 2011 ජූනි මස 20 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මගින් 2011 ජනවාරි 03 දින සිට රු.45,000 දක්වා වැඩිකර තිබුණ නමුත් ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

ii. කාර්ය මණ්ඩලය වෙත ගෙවා තිබූ රු.7,771,220 ක් වූ ප්‍රවාහන දීමනා සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

| | | |
|---|---|---|
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ජේදය | වැඩ හා සේවාවන් සඳහා ලබා දිය යුතු උපරිම කාර්ය පූර්ව අත්තිකාරම් මුදල කොන්ත්‍රාත් මුදලින් 20% ක් වුවත් ඊට පටහැනිව 50% සිට 75% දක්වා රු.39,939,818 ක අත්තිකාරම් සැපයුම්කරුවන් වෙත ගෙවා තිබුණි. |
| (ඊ) | 2008 දෙසැම්බර් 31 දිනැති මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ජාතික අයවැය චක්‍රලේඛ අංක 142 | සංස්ථා හා මණ්ඩල සේවකයන් සඳහා ලබාදිය හැකි උත්සව අත්තිකාරම් මුදල රු.5,000 ක් වුවත් මාසක වැටුප උත්සව අත්තිකාරම් ලෙස ගෙවීම නිසා රු.3,220,095 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (උ) | 2009 ජූනි 01 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 34 (I) | සංස්ථා හා මණ්ඩල සේවකයන් සඳහා නිර්දේශ කර ඇති සංයුක්ත දීමනා රේට් ගණන් වලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත අනුමත කරගත් විවිධ රේට් ගණන් මත සංයුක්ත දීමනා රු.8,311,843 ක් ගෙවා තිබුණි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 209 ක අතිරික්තයක් වූ අතර , ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 32 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 177 ක හෙවත් 553.12 % ක වර්ධනයක් දැක්විණි.

එම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය පිළිබඳව විග්‍රහයක් පහතින් දැක්වේ.

| | විචලනය | | |
|---|---|---|---|
| | වාසිදායක | අවාසිදායක | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| **ආදායම** | | | |
| ලොතරැයි විකුණුම් ආදායම | 1,229 | - | |
| වෙනත් ආදායම් | - | 33 | |
| | 1,229 | 33 | 1,196 |
| **වියදම්** | | | |
| නියෝජිත කොමිස් | - | 235 | |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | - | 172 | |
| ත්‍යාග ප්‍රදානය කිරීම් | - | 562 | |
| පරිපාලන වියදම් | - | 10 | |
| බෙදාහැරීමේ වියදම් | - | 4 | |
| මූල්‍ය වියදම් | 4 | - | |
| වෙනත් වියදම් | - | 95 | |
| අගය එකතු කිරීමේ බදු | - | 49 | |
| ජාතිය ගොඩනැගීමේ බදු | 44 | - | |
| ආදායම් බදු | 44 | - | |
| භාණ්ඩාගාරයට විශේෂ ප්‍රදාන | 16 | - | |
| | 108 | 1,127 | 1,019 |
| | | | 177 |

## 3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය සඳහා මන්නාරම මුරුක්කන් ප්‍රදේශයේ රු. මිලියන 50 ක වියදමින් සංචාරක බංගලාවක් ඉදිකිරීම සඳහා ගිවිසුමකට එළඹ තිබූ අතර ගිවිසුම් ප්‍රකාර ඉදිකිරීම් කටයුතු 2011 මැයි මස 05 දිනෙන් ආරම්භ වී දින 180 කින් එනම් 2011 නොවැම්බර් මස 05 දින නිම කල යුතු වුවත් 2012 මාර්තු 31 වන විටත් අදාල ඉදිකිරීම් කටයුතු නිම කර නොතිබුණි.

(ආ) මණ්ඩලය 1986 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා බදු පදනම මත ලබාගෙන තිබූ අනුරාධපුර ප්‍රදේශයේ පිහිටි ගොඩනැගිල්ලක සංචාරක බංගලාවක් පවත්වාගෙන ගොස් තිබුණි. මෙම ගොඩනැගිල්ල නවීකරණය කිරීම සඳහා 2011 නොවැම්බර් 01 දින රු.7,403,596 කට පෞද්ගලික සමාගමකට බාර දී තිබුණ අතර ගිවිසුම් ගත දිනයට ඉදිකිරීම් අවසන් කර නොතිබුණ. ඉදිකිරීම අධීක්ෂණය සඳහා පත්කර තිබූ ආයතනයට රු.505,253 ක් ගෙවා තිබුණ ද ඔවුන් විසින් සිදු කරන ලද අධීක්ෂණ කටයුතු පිළබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. තවද බදු කාල සීමාව අවුරුදු 4 ක් පමණක් ඉතිරිව තිබියදී මෙවැන අලුත්වැඩියාවක් සිදු කිරීම ආර්ථික වශයෙන් යෝග්‍ය වන්නේ ද යන්න විගණනයේදී ගැටලුසහගත විය.

(ඇ) මණ්ඩලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2010 ජූලි 21 දින රු. මිලියන 300 ක් ගෙවා ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් ඉඩමක් මිලදී ගෙන එම ඉඩමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.මිලියන 619 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඉදිකිරීම් ආරම්භ නොකර කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ලක ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් රු.මිලියන 13.58 ක බදු කුලී බාහිර පාර්ශවයක් වෙත ගෙවීමට සිදු වී තිබුණි.

(ඈ) අලෙවි ප්‍රවර්ධන වැය ශීර්ෂය යටතේ පර්ව සැලසුම් කිරීමකින් තොරව රු.4,000,000 ක වියදම් දරා තිබුණි.

### 3.2 <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලොතරැයි ත්‍යාග පිරිනැමීම සඳහා 1996 වර්ෂයේ සිට මණ්ඩලය පවුමක් රු.8,668 බැගින් මිලට ගෙන තිබූ පවුම් 16 ක, පවුමක් 4,860 බැගින් මිලට ගෙන තිබූ පවුම් 2 ක හා පවුමක් 9,299 බැගින් මිලට ගෙන තිබූ පවුම් 57 ක එකතු වටිනාකම වූ රු.678,451 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ත්‍යාග ප්‍රදානය

සඳහා යොදා ගැනීමකින් තොරව ගබඩාවල තිබූ අතර එම රන් භාණ්ඩ වල වර්තමාන වටිනාකම රු.1,185,000 ක්ව තිබුණි.

(ආ) ත්‍යාග ලෙස බෙදාහැරීම සඳහා 2009 වර්ෂයේ මිලදී ගෙන තිබූ එකතුව රු.1,104,536 ක් වූ මෝටර් බයිසිකල් 5 ක් හා ත්‍රී රෝද රථ 2 ක් සමාලෝචිත වර්ෂය දක්වාම බෙදා හැර නොතිබුණු අතර එම රථ මණ්ඩලය සතු වාහන අංගනයේ අනාරක්ෂිතව ගාල් කොට තිබුණි.

(ඇ) සෙවණ ලොතරැයි ප්‍රචාරණ කටයුතු සඳහා මිලට ගෙන තිබූ එකතුව රු.536,470 ක් වූ පිත්තල ලාම්පු, බයිසිකල් , රූපවාහිනි, මහන මැෂින් , තේ කට්ටල, ටී ෂර්ට් සහ කුඩ යනාදී තොග අනාරක්ෂිතව ගබඩා කර තිබූ අතර එම තොග ත්‍යාග සඳහා බෙදාහැරීමට හෝ වෙනත් කටයුත්තක් සඳහා හෝ යොදාගෙන නොතිබුණි.

## 3.3 <u>හඳුනාගත් පාඩු</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය, ඉන්දියානු සමාගමකින් ආනයනය කර තිබුණ ක්ෂණික ලොතරැයිපත් වරායට ලැබුණු පසු දින 07 ක් ඇතුළත නිෂ්කාශනය කර නොගැනීම නිසා රු.357,291 ක නිෂ්කාශන අධිභාරයක් ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල සෙවණ ක්ෂණක ලොතරැයිපත් 6,700 ක් හා සමෘද්ධි ක්ෂණක ලොතරැයිපත් 32,900 ක් වතුරෙන් විනාශ වීම නිසා මණ්ඩලයට රු.67,914 ක පාඩුවක් සිදු වී තිබුණි.

(ඇ) 2008 දෙසැම්බර් මස 17 දිනැති අංක එම්එෆ්/2/2/ඩීඑල්බී/ටීඑන්ඩී/02 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාර දේශීය සැපයුම්කරුවන්ගෙන් ලොතරැයිපත් මුද්‍රණය කිරීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය තුල පමණක් මණ්ඩලයට රු.47,101,200 ක සෙස් බදු හා රු.22,703,677ක ආනයන තීරු බදු මුදලක් නිෂ්කාර්යව වැය කිරීමට සිදු වී තිබුණි.

(ඈ) මණ්ඩලය 2002 ජූනි 12 දින ප්‍රමුඛ බැංකුවේ ආයෝජනය කරන ලද රු.5,000,000 ක ආයෝජන හා එම ආයෝජන වෙනුවෙන් ලැබිය යුතු පොලී ආදායම ද මණ්ඩලයට අහිමි වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ගිණුම් වලින් එකී ආයෝජන මුදලට සමාන අඩමාන ණය ප්‍රතිපාදනයක් සලසා තිබුණි.

## 3.4 මානව සම්පත් කළමනාකරණය

අනුමත කාර්ය මණ්ඩලය 281 ක් පමණක් වුව ද මණ්ඩලය විසින් කාර්ය මණ්ඩලය 304 ක් සේවයේ යොදවා තිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු හා අතිරික්තතා තත්ත්වය පහත වගුවෙන් දැක්වේ.

| සේවක වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|
| විධායක ශ්‍රේණි | 25 | 24 | 01 | - |
| විධායක නොවන ශ්‍රේණි | 256 | 242 | 14 | - |
| කොන්ත්‍රාත් පදනම | - | 38 | - | 38 |
| එකතුව | 281 | 304 | 15 | 38 |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත සහ තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) මානව සම්පත් කළමනාකරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) වියදම් කළමනාකරණය

(ඈ) තොග